27 වන පිටෙන්

''එහෙනං මට යන්න අවසර අපේ හාමුදුරුවනේ''

ඔහු ලොකු හාමුදුරුවන්ගේ දෙපා වැඳ සමුගත්තේ අරමුණක් නැති සිතකිනි. අනතුරුව ඔහු පන්සලේ මල් ආසනය වෙත ගියේ බුදුන් වැඳීමටය. මීට ටික දිනකට කලින් තමා වයලට් සමග පන්සල් ආවේ මල් වට්ටියක් ද රැගෙනය. ඒ හීල් දානය පිළිගැන්වීම සඳහාය. මල් ආසනය වෙත තබා බුදුන් වැන්ද  ඒ මල් පරවී ඇත. තවත් සැදැහැවතුන් පිරිසක් ඒ පරවූ මල් කුණු කූඩයට හලා බුදුන්ට අලුත් මල් පුදයි. අලුත් මල් වලින් ගලා එන සුවඳට මිනිසුන් කැමති බව ඔහු දනී. එහෙත් පරවූ මල් ගැන ඔහුට දුකක් දැනෙයි. ඔහු පරවූ මල් හැලූ කුණු කූඩය දෙස බලා හිඳ අසළ ඇති තෙල් බෝතලයකින් තෙල් වත්කර පහන් පෙළක් ආලෝක කළේය. එම මැටි පහන් පේළියෙන් ලද ආලෝකයෙන් තම සිත පහන් වන බව ඔහුට නොහැඟුණි. බුදුන් වැඳ ඔහු පැල්පත වෙත පා නැගුවේ පරාජිත සිතෙනි.

එදා රෑ පැදුරේ ඇලවී ඔහු බොහෝ දේ කල්පනා කළේය. කාලයක් පෙරුම් පුරා දුටු සුන්දර සිහින, නපුරු සිහින බවට පෙරළේ යැයි ඔහුට බියක් දැනුණේය. අනෙක් පස ඇලවී සිටින වයලට් සමග ඔහු බොහෝ දෑ දෙඩුවේය.

''ඔය කුණු කන්ද අයින් කරල ඕක මල්වත්තක් වගේ ලස්සන කරනවා කියන්නේ වයලට්. කුණුත් සම්පතක්ලු''
වයලට්ගේ හූ මිටි තැබීම් මැද ඔහු මදක් නිහඬ වේ. වයලට් නිහඬ වූ බව දැනගත් විගස ඔහු නැවත කතාව පටන් ගනී.

''කුණු විකුණලා ගත්තත් ඒ සල්ලිවලින් ගන්න මල් හරි සුවඳයි වයලට්. ඒ සුවඳට තමයි කවුරුත් කැමති. දැන් බලන්න වයලට් මල් සුවඳට බඹරු ඇදෙනවා. මී මැස්සො රොන් අරගෙන මී වද බඳිනවා. බඹරු මී මැස්සො විතරක් නෙමෙයි. මිනිස්සුත් ඇදෙනවා. ඒ වුණාට දෙවියන් වහන්ස් මේ ලෝකෙට මී මැස්සො, බඹරු වගේම නිල මැස්සොත් මැව්වෙ ඇයි ? ඔය ගඳ, සුවඳ නැත්තං ඌට ජීවත් වෙන්න බැහැනේ. මටත් ඔය ගඳ නොතේරුණේ ඒක නිසා වෙන්න ඇති.''

ඔහු එදා රෑ බොහෝ දෑ දෙඩුවේය.

''ඔතන ලස්සන මල් වත්තක් හදල මැෂින් ගෙනල්ලා කුණු වලට ඔය මොනාද මන්ද කරල මිනිස්සුන්ට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් දෙයක් කළාම මටත් පුළුවන් වෙයිද දන්නෙ නැහැ රස-'සාවක් හොයාගන්න. ඕව මැෂින් වලට දාන්නත් මිනිස්සු එපායැ. ඒ මිනිස්සුන්ට ගඳ ඉවසගන්න පුළුවන් වෙන්නත් එපායැ. නේද මං අහන්නේ වයලට්. ඒක මට ලොකු සුදුසුකමක් වේවි නේද වයලට්''

වයලට්ට නින්ද ගොස් ඇති බව ඔහුට හැඟුණේ සිහින් ගෙරවිලි හඬ සමගිනි. ඔහුද නිහඬව දෑස් පියවාගන්නට උත්සාහා ගත්තේය. එහෙත් මැදියම් යාමය වෙන තුරු ඔහුගේ දෑස් පියවුණේ නැත. යන්තම් දෑස් පියවුණු පසු ඔහු දුටුවේ පෙ-ර්ුණුවක් සහ ගොඩනැගිලි වටේ පිපී ඇති මල් යායකි. දුම්රොටු නගින පෝරණුව මතින් හිරු එළිය වැටී ඔහු අවදිවන්නේ රැකියාවට යාමටය. නිල ඇඳුමක් ගත දවටා හිස් වැස්මක් පැළඳ සිටින ඔහු ඒ දෙසට ගමන් කරයි. අවට පිපී ඇති මල්වලින් බඹරු රොන් ගන්නා අයුරු පියකරුය. වත්තේ සියල්ලෝම ඒ මල් ගොමු දෙස බලා සිටින්නේ සිනා මුසු දෑසිනි. පාතිමාලාගේ, සූර්යකාන්තිලාගේ සුවඳ පරයා හමා එන මල් සුවඳින් කුසද පිරී ඇති බව ඔහුට හැඟේ. මල් සුවඳ මත පාවී ගිය ඔහු පෝරණුවේ දුම්රොටු අතරින් පියාඹා ගොස් කොහෝදෝ සැඟවුණු බව දැනුණේ ඒ සිහින විජිතය මැදිනි.

හිමිදිරියේ ලෑලි තීරු අතරින් පැල්පතට එබිකම් කළ හිරු රැස්වල එළියෙන් වයලට් අවදි වුණි. ඇය ඔහුගේ උරහිසින් අල්ලා සෙලවූයේ අදත් සුපුරුදු රැකියාවට යාමටය. එහේ ඔහු සෙලවුණේ නැත. හිමිදිරිය සිසාරා හඹා ගිය වයලට්ගේ දුක් අඳෝනාවෙන් මුළු වත්තම ගිගුම් දුනි. සියල්ලෝම වාගේ අවදි වී ''කුණාගේ ගෙදර පැත්තෙන්'' කියා කලබලයෙන් දුවගෙන ආහ. එහෙත් ඒ වන විටත් ඔහුගේ පණ නල කුණු සුවඳ හමන වා තලය වෙත මුසු වී තිබුණි.

# සිරිලක වලව් වරුණ

පද්මා එදිරිසිංහ

ඉලව්ව තරමටම වලව්ව ද අපට ඉතා හුරු වචනයකි. සිවුරු පො රවා නොගත් වලව්වේ හාමුදුරුවරුන් ද වලව්වේ ළමා එතනින් ද අපේ සංස්කෘතියට කිඳු බැස ඇති සෙයකි. සමාජීය වශයෙන් එක් කලෙක මොවුහු ඉතා ඉහළ තලයක වැජඹුණ හ. ගැමියන් මේ වලව්වලට ඇතුළු වූයේ පස්සා දොරිනි. වාඩි වූයේ කොළොම්බු කොට මත ය.

හොරගොල්ලේ වලව්වේ ද පැවැති මේ සිරිතට හෝ දුසිරිතට තිත දැමූයේ ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා බව මා කුඩා කල අසා ඇත්තේ එය අල්ලපු ගමේ වලව්ව නිසා විය හැකි ය. කොළඹ නුවර මහා මාර්ගයත් සමග මේ වලව්ව ඒ ඉසව්වේ ප්‍රාදුර්භූත වූ අන්දම ද එක්තරා රස කතාවකි. අද බොහෝ වලව් ගරා වැටුණු ස්වරූපයක පවතී. ඈත මාතලේ කඳු වැටිය පා මුල නිදහස් හා නිසොල්මන් ඉසව්වකට වී අපේ ඈත අතීතය ගැන පර්යේෂණවල යෙදෙමින් පොත පත ලියන මිරැන්ඩෝ ඔබේසේකර සූරීන් දැනට වසර කීපයකට පෙර මේ වලව් නාමාවලියක් මා වෙත එව් ය. එය කුඩා ග්‍රන්ථයකි. එහෙත් වෙහෙස දරා සකස් කළ නාමාවලිය මෙන් ම ඉතා වැදගත් කරුණු ඇතුළත් ප්‍රස්තාවනාවක් ද එහි අඩංගු වේ. මුලින් ම කර ඇත්තේ වලව් යන වචනයේ නිරුක්තිය සෙවීම ය. ශ්‍රී ලංකාද්වීප වර්ණනා හා කන්ද උඩරට සමාජ සංවිධානය යන ග්‍රන්ථ ඇසුරෙන් වලව් යන්න වලවුම් යන ද්‍රවිඩ වචනයෙන් ප්‍රභව වූ බව පෙන්වා දීමට ඔහු උත්සාහයක් දරා තිබේ.



නඩුව යන්නට ද්‍රවිඩ බසින් වලකු යන්න ව්‍යවහාර වන බව ද මේ නිසා ම නඩු අසන ස්ථානය වලකුම් නැතහොත් වලවුම් වශයෙන් හැඳින්වුණු බව ද ඔහු තර්ක කරයි. ඇත්තට ම මේ වලව් එකල ගමේ අධිකරණ මධ්‍යස්ථානය විය. අද ගරා වැටුණු වලව්වල පවා දඬු කඳෙක් ශේෂයෝ සැතැපෙති. මේ වරදකරුවන් බැඳී තබන දඬුකඳ ය. නායක්කාර රජවරු රට පාලනය කරන සමයේ දී මේ වලව් රට පුරා ව්‍යාප්ත වීම ද ද්‍රවිඩ සංස්කෘතිය හා වලව් අතර සම්බන්ධයේ තවත් සාක්ෂ්‍යයකි.

එක් එක් ප්‍රදේශවල පිහිටි වලව් ලේඛන නම් වශයෙන් සවිස්තර ව දක්වා ඇත. එය ආයාසකර පර්යේෂණයකි. ඒ නම් දැක්වීම මෙවන් කුඩා ලිපියකින් කළ නො හැකි ය. සංඛ්‍යා පමණක් දක්වමි. උතුරු මැද පළාත් වලව් 28 කි. වයඹ පළාතේ 24 කි. බස්නාහිර පළාතේ 42 කි. දකුණු පළාතේ 4 කි. සබරගමු පළාතේ 141 කි. ඌව පළාතේ 43 කි. වලව් 174 කින් හෙබි මධ්‍යම පළාත ප්‍රමුඛ තැන ගනී. බොහෝ තැනක මේ වලව්වල ආදි ම පදිංචිකරුවන් ගේ සුලමුල ද දී ඇත. මේ මුල් පදිංචිකරුවා අනිවාර්යයෙන් ම ඉතා ධනවත් හා බලවත් තැනැත්තෙකි. බොහෝ විට දේශපාලන භූමිකාවේ ද රඟපෑවෙකි.

මුල දී වලව් යන වචනය ගොවි වංශයේ ඉසුරුමත් නිවෙස්වලට සීමා වුව ද පසු ව ධනයෙන් හා බලයෙන් උච්ච ස්ථානයට පත් වූ සෙසු කුලවල ඇත්තන් ගේ නිවෙස් ද වලව් වශයෙන් හැඳින් වූ බව පෙනේ. උදාහරණ වශයෙන් මරදානේ රාජපක්ෂ වලව්වේ මුල් හිමිකරු ගොවි වංශිකයෙක් නො වේ. අද මේ වලව්වේ නටබුන් පවා නැත්තේ ආනන්ද විදුහල ඒ ඉසව්ව අරා යෝධයකු මෙන් නැඟී ඇති බැවිනි.

ඒ රාජපක්ෂ වලව්වේ මිනීවළ මත ය. ලන්දේසි යුගයේ දී කුරුඳු ඒකාධිකාරයට සම්බන්ධ කටයුතු පැවැරුණු සලාගම කුලය කොළඹ නගරය තුළ සිය බලය ව්‍යාප්ත කිරීමේ සංකේතයක් වැන්න ඒ වලව්ව.

කතලුවේ අට දාහවත්තේ වලව්ව අද මේ සියලූ ම වලව්වල ආදිතමයා වශයෙන් සැලැකිය හැකි ය. එහි ගෙහිමියා මා සමග කී කරුණු අනුව එය ගොඩනගා ඇත්තේ පෘතුගීසි යුගයේ අග භාගයේ ය. සියලූම ඓතිහාසික සාධක ඔහු සතු ය. පෘතුගීසි යුගයේ දී ලංකාවට ආ පර්ඩිනන්ඩස් නම් ස්පාඤ්ඤ ජාතිකයකු සයුරාසන්න මේ අට දාහේ වත්තට පෙම් බැඳ ඉන් පස මූණමල්පේ සිංහල ස්ත්‍රියකට පෙම් බැඳ ඒ වත්ත මිල දී ගෙන එහි මහා මන්දිරයක් තනා ගමේ විහාරයට ගොස් සිංහල නමක් ලබා ගෙන යට කී ස්ත්‍රිය හා විවාහ වී එහි පදිංචි වූයේලූ.

මේ ඔබේසේකර පවුලේ නියම වෘතාන්තය විය හැකි ය. විය නො හැකි ය. අවිනිශ්චිත බව මතු වන්නේ කාල ප්‍රවාහය අනුව ය. සියල්ල සිදු වී ඇත්තේ දැනට වසර 400 * 500 ට පමණ පෙර ය.

මේ පවුල පසු ව කතලූවේ සිට වේයන්ගොඩ ප්‍රදේශයට සංක්‍රමණය වූ බව පැහැදිලි ය. ආවාහ විවාහ නිසා මේ පරපුර හා සම්බන්ධධ ව සිටි බණ්ඩාරනායක පවුල ද උතුරු කොළඹ සිල්වර්ස්මිත් හෙවත් බඩල් වීදියේ සිට වේයන්ගොඩ පළාතට ආවේ යට කී සංක්‍රමණයෙන් පසු ද පෙර ද යන්න මම නො දනිමි. එක් දෙයක් නම් දනිමි. ඒ අවට ඉසව්ව ධනපතියන් ගේ වතුකරයක් බවට පත් වූ වග යි. කොළඹ නුවර මහා මාර්ගය තැනෙත් ම මේ පවුල් දෙකේ සෞභාග්‍යය ද බලපරාක්‍රමය ද වැඩිණි. හිරු නොබසින අධිරාජ්‍යය නියෝජනය කළ අති ශ්‍රේෂ්ඨ බ්‍රිතානී ගවර්නන්දු ගේ හොඳ ම හිතවතා වූයේ හොරගොල්ල වලව්වේ මහ මුදලිතුමා නැතහොත් වාසල මුදලිතුමා ය. ඒ පරපුරෙන් පැවැති අයකු මෙහෙයැ වූ ඒ සමාජ පෙරළිය මේ ලිපියෙන් බැහැර කරන්නේ ඉඩ ප්‍රමාණය අනුව ය.

වලව් අතරින් අති විශාල භූමි ප්‍රමාණයක් සතු වූ වලව්වකි. මඩුවන්වල වලව්ව මා අසා ඇති අන්දමට එය සතු ඉඩම් ප්‍රමාණය අක්කර 40000 කි. එහෙත් මිරැන්ඩෝ ඔබේසේකර එය අක්කර 16500 ට අඩු කරයි. ඒ විශාල ඉඩම එකල රජු ගෙන් ලැබුණු තෑග්ගකි. ඒ සුදු ගෝනකු අල්ලා රජුට තෑගි කිරීම වෙනුවෙනි. මේ තෑග්ග දුන්නේ ඩිඩි විමලධර්මසූර්ය රජු බව ඔහු සඳහන් කළ ද මෙවන් තෑගි ඇත්තට ම පිරිනැමුවේ ලංකාවේ ප්‍රථම සත්වෝද්‍යාන සංකල්පය ක්‍රියාත්මක කළ ඩිඩි රාජසිංහයන් ය. ඔහු සිර කෙළේ සතුන් පමණක් නො වේ. අමුතු පෙනුමෙන් යුතු විවිධ ජාතීන්ට අයත් මිනිසුන් පවා සිර කර ඔහු කුරිරු සතුටක් ලැබී ය. අද මෙන් එදා ද නම ගිය අපරාධකරුවෝ වූහ. කොලොන්නේ අතලාවෙල එවැන්නෙකි. මොහු අල්ලා දීම වෙනුවෙන් මඩුවන්වෙල දිසාව පසු ව පනාමුර ගම්මානයෙන් ද පුදනු ලැබී ය. වලව්ව සතු වූ අක්කර 40000 සැදුම් ලද්දේ මෙසේ විය හැකි ය. අද එහි ප්‍රතාපවත් ස්වරූපය කාලය විසින් ද සොරුන් විසින් ද යටපත් කරනු ලැබ පාලකවරුන් ගේ නොසැලකිල්ලෙන් ද අභාවයට ගොසිනි. මේ වලව් ඓතිහාසික ස්මාරක වශයෙන් ද සැලැකිය හැකි ය. යටගියාව පිළිබඳ විවිධ පුවත් ඒවා තුළ හැංගි මුත්තන් කෙළී.
මරදානේ රාජපක්ෂ වලව්ව බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා ඇහැලේපොළ අදිකාරම් සමග කන්ද උඩ රට අල්ලා ගැනීමට කුමන්ත්‍රණ කළ ස්ථානයක් වී බව ගල්කිස්සේ ජී. එච්. පී. ද සොයිසා කී, කළ කතා අනුව පැහැදිලි ය. ආණ්ඩුකාරයා කිට්ටුවෙන් ඇසුරු කළ රාජපක්ෂ මහ මුදලි ගේ වලව්ව ශ්‍රී වික්‍රම රාජසිංහයන් ගේ බිසෝවරුන්ට ඇඳුම් ආයිත්තම් සැපැයූ තැන ද විය. ඒ ඔවුන් වෙල්ලෝරයට පලවා හැරීමට ප්‍රථම කොළඹ නතර කර සිටි කාලයේ ය. ඔවුන් ගේ ඇඳුම් පැළඳුම් සියල්ල එක්නැලිගොඩ නිලමේ ඇතුළු පිරිස පැහැර ගොසිනි. ඒ ඇහැලේපොළ කුමාරිහාමිට කළ දරුණු අපරාධයට ප්‍රතික්‍රියා වශයෙනි.

මෙවන් සිද්ධීන්ට සම්බන්ධ වීමට අමතරව මේ වලව් පැරැණි කොඩි සේසත්, ධජ, පතාක, පුස්කොළ පොත්, පැරැණි ඇඳුම් ආයිත්තම් විවිධ මාදිලියේ ස්වර්ණාභරණ ආදියේ කොෂ්ඨාගාර වශයෙන් ද පැවැතිණි. මේවා ද කාලය මගින් ගිල දමා ඇති සැටි ඛේදජනක ය. එංගලන්තය වැනි යුරෝපා රටවල් අතීතය නොසලකන වත්මනට පමණක් ආවඩන රට රාජ්ජ වශයෙන් සැලැකුණ ද ඒ රටවල සංචාරය කරද්දී පැහැදිලි ව පෙනෙන දෙයක් නම් එවැනි අතීත ස්මාරක ආරක්ෂා කිරීමට ඔවුන් දරන ඉමහත් වෑයම යි.

මේ ලිපිය අවසන් කිරීමට පෙර වලව්වල අශෝභන පැත්ත ද අවධානයට යොමු කිරීම සාධාරණ ය. ඇතැම් වලව්වල ඇත්තෝ තමන් අහසින් පාත් වූ පිරිසක් යැයි මවා ගත් අභිමානයෙන් අවට සමාජයෙන් දුරස් වූහ. එවන් වලව්වේ හාමු කෙනකු ගමේ ඡන්දයට ඉදිරිපත් වූ අවස්ථාවේ ඒ ගමේ බෙදා හැරිය කැලෑ පත්තරයක අඩංගු පැදියක් යට කී ග්‍රන්ථයෙන් ම උපුටා දක්වමින් මේ ලිපිය අවසන් කරමි.

ඉලව් වලව්වේ රොබට් හාමුට
අප සිහිවන්නේ මෙවැනි වෙලේ
ගමේ ගොඩේ පස් පාගන්නේ
උපන්නාට පසු අදනෙ බොලේ

කරා දුරාවේ හින්නා අප හට
වලව්ව කවදද උදව් කළේ
තව පාගන්නට ඡන්දය දී පිය
පා ලෙව කන්නට වලව් පෙළේ